Department of Education,Sabaragamuwa Province/ Weekly School

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව - සති පාසල

| ශ්‍රේණිය - 10 (I වාරය) | විෂය - චිත්‍ර කලාව | සතිය - පෙබරවාරි 04 |
|---|---|---|

01) පාඩම හෝ ඒකකය - 7.1.1. ගඩලාදෙණිය විහාරය

02) ඉගෙනුම් ඵල -

- ගඩලාදෙණි විහාරයේ ගෘහ නිර්මාණ, මූර්ති, කැටයම්, නම් කරයි.
- ගඩලාදෙණි විහාරයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ගඩලාදෙණි විහාරයේ ගෘහ නිර්මාණ ඇතුළු කලා අංගවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

03) ශිෂ්‍යා කළ යුතු කාර්යයන් -

- ගඩලාදෙණිය විහාරය හා සබැඳි වර්ණ ඡායාරූප සී.ඩී. තැටි, ගඩලාදෙණි විහාරය සිතුවම් හා කැටයම් සහිත පින්තූර නරඹන්න.
- ගඩලාදෙණි විහාර පිළිබඳ පෙර දැනුම ආවර්ජනය කර ගන්න.
- ගඩලාදෙණිය විහාරය පිළිබඳ වැඩිදුරටත් තොරතුරු එක් රැස් කරන්න.
- පහත ලබා දී ඇති කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කර ඒ ඇසුරෙන් කාර්ය පත්‍රිකාවේ ඇති ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- පාසල ආරම්භ වූ පසු ඔබගේ අනාවරණය පන්ති කාමරයේ ඉදිරිපත් කරන්න.

<u>කාර්ය පත්‍රිකාව</u>

1) ගඩලාදෙණිය විහාරයේ දැකිය හැකි වාස්තු විද්‍යා අංග හා මූර්ති නම් කරන්න.

2) ගඩලාදෙණි විහාරයේ ඓතිහාසික පසුබිම වරහන් තුළ ඇති අනු කොටස් යොදා ගනිමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (යුගය/කාලය, අනුග්‍රහය, ශිල්පියා)

3) වාස්තු විද්‍යා නිර්මාණවල කලාත්මක ශෛලිය සඳහා පදනම් වූ වරහන් තුළ ඇති අනු කොටස් යොදා ගනිමින් විස්තර කරන්න. (සම්ප්‍රදාය, වාස්තු විද්‍යාත්මක ප්‍රවේශ/සැලසුම්/ ආකෘති, මාධ්‍ය, ශිල්ප ක්‍රම)

4) ගඩලාදෙණි විහාරයේ බුදු පිළිමය පිළිබඳ වරහන් තුළ ඇති අනු කොටස් යොදා ගනිමින් කලාත්මක ඇගයීමක් කරන්න. (මුද්‍රා, ආසන ක්‍රමය, සිවුර, මුහුණේ ප්‍රකාශනය)

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක -

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - Course : 10 ශ්‍රේණිය චිත්‍ර කලාව - https://www.enenapiyasa.lk
- ගුරු ගෙදර - නැත
- වෙනත් - (YouTube) - https://youtu.be/wzY4ATo_moo
  https://youtu.be/6cBgHo9_iWE
  https://youtu.be/zmzh3mmX_8I
  https://youtu.be/aZRvhYOK1Gk
  https://youtu.be/bIEUkN3SfXg
- කියවීම් පත්‍රිකාව -

– සද්ධර්මතිලක විහාරය හෙවත් ගඩලාදෙණි විහාරය ගම්පොළ යුගයට අයත් නිර්මාණයකි.
– ක්‍රි. ව. 1341-1351 කාලයට අයත් ගම්පොළ යුගයේ රජ කළ සතරවන බුවනෙකබාහු රජුගේ රාජ්‍ය කාලයේදී ධර්මකිර්ති හිමියන්ගේ අනුශාසනාව පරිදි හා සේනාධිලංකාර ඇමැතිගේ මූලිකත්වයෙන් මෙම විහාර නිර්මාණ කටයුතු සිදු කර ඇත.
– මෙම විහාරයේ ගෘහ නිර්මාණ ශිල්පියා ලෙස කටයුතු කරන ලද්දේ දකුණු ඉන්දීය ශිල්පියකු වන ගණේෂ්වරාචාර්ය හා ඔහුගේ අනුගාමික ශිල්පීන් ය.
– මෙම සුවිශේෂී ගොඩනැගිල්ල තනි කළුගලෙන් නිමවා ඇති අතර, මණ්ඩපය, අන්තරාලය හා ගර්භගෘහය යන ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.
– ගඩලාදෙණි විහාරයේ මණ්ඩපය තනි කළුගලින් නිමවා ඇත. මෙහි පියස්ස පැතලි ය. පාදමෙහි නටන්නන්ගේ සහ වයන්නන්ගේ රූප පෙළක් කැටයම් කර ඇති අතර එම රූප ජීවශක්තියෙන් සහ චලනයන්ගෙන් යුක්ත ය.
– සිවුරුැස්, අටැස් කොටස්වලින් යුතු ව දොරටුව ඉදිරිපස දෙකළවර ඇති තුන් ඇඳුතු ගල් කුලුනු හා දාගැබක හැඩය ඇති "ගෙඩිගෙය" නම් වූ වෘත්තාකාර ශිඛරයක් සහිත පියස්සකින් සමන්විත මෙම බෞද්ධ විහාරය, දකුණු ඉන්දීය විජයනගර් ගෘහ නිර්මාණ කලා ලක්ෂණ පෙන්වයි.

05) අතිරේක පොත්/සඟරා -

- 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- චිත්‍ර කලාව - රුවන්ති කුරේ
- චිත්‍ර කලා ඉතිහාසය - තිලකරත්න දිගන්වෙල

**සැකසුම - නම - කේ.කේ.කේ.එච්.එච්.එච්. පොල්වත්ත.**

**අධ්‍යාපන ආයතනය - කෑ/දෙහි/ නක්කාවිට ක.වි.**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**